# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1826/37 – 2013 සැප්තැම්බර් 06 වැනි සිකුරාදා – 2013.09.06

(රජයේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/22/08/2012.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

එක් පාර්ශ්වයක් වශයෙන්

ඩී. බී. දිසානායක මයා, අංක 15A/24, ආර්. එච්. ගුණවර්ධන මාවත, බදුල්ල.

සහ

අනෙක් පාර්ශ්වය වශයෙන්

ලංකා විදුලිබල මණ්ඩලය, අංක 50, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, කොළඹ 02.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය ගාමිණී ලොකුගේ වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්,

වත්තල, හැඳල, නිමල මරියා මාවත, අංක 33/2හි පාලිත වීරසේකර මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ගාමිණී ලොකුගේ,**
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය.

2013 අගෝස්තු මස 23 වැනි දින,
කොළඹ දී ය.

1A – G 18227 – 205 (2013/09)

*මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය: IR/22/08/2012.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

එක් පාර්ශ්වයක් වශයෙන්

ඩී. බී. දිසානායක මයා, අංක 15A/24, ආර්. එච්. ගුණවර්ධන මාවත, බදුල්ල.

සහ

අනෙක් පාර්ශ්වය වශයෙන්

ලංකා විදුලිබල මණ්ඩලය, අංක 50, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, කොළඹ 02.

**ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ,**

ලංකා විදුලිබල මණ්ඩලයේ සේවයේ නියුතු ඩී. බී. දිසානායක මහතාට 2002.09.11 වැනි දින සිට 1 වැනි ශ්‍රේණියේ ලිපිකරු තනතුර ලබා නොදීමෙන් ඔහුට යම් අසාධාරණයක් සිදුවූයේද යන්න සහ එසේ අසාධාරණයක් සිදුවූයේ නම් ඔහුට හිමිවිය යුතු සහන කවරේද යන්න පිළිබඳව වේ.

**වී. බී. පී. කේ. වීරසිංහ,**
කම්කරු කොමසාරිස්.

2013 ජූලි මස 31 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

09 – 913

---

මගේ අංකය: IR/15/13/2011.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කරුණු පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ඒ. එම්. එන්. ඒ. ඩී. රෝහිත ප්‍රේමලාල් මයා, අංක 5/30, කිරිල්ලවල, කඩවත.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, අංක 500, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය, ගාමිණී ලොකුගේ වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්

බොරලැස්ගමුව, අබේරත්න මාවත, අංක 28 හි, එස්. කාරියවසම් මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ගාමිණී ලොකුගේ,**
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය.

2013 අගෝස්තු මස 23 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/15/13/2011.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ඒ. එම්. එන්. ඒ. ඩී. රෝහිත ප්‍රේමලාල් මයා, අංක 5/30, කිරිල්ලවල, කඩවත.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, අංක 500, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු** වනුයේ,

1. ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ කාර්මික නිලධාරි I වැනි ශ්‍රේණියේ සේවය කරන ඒ. එම්. එන්. ඒ. ඩී රෝහිත ප්‍රේමලාල් මහතාව ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් 2000.09.30 දින සිට ක්‍රියාත්මක වන පරිදි කාර්මික නිලධාරි I වැනි ශ්‍රේණියට උසස් නොකිරීම යුක්ති සහගතද යන්න හා නොඑසේනම් ඔහුට කුමන සහනයක් හිමිවිය යුතුද යන්න පිළිබඳව, සහ

2. ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් ඒ. එම්. එන්. ඒ. ඩී. රෝහිත ප්‍රේමලාල් මහතාට 2006 වසරේ සිට ක්‍රියාත්මක වන පරිදි කාර්මික නිලධාරි විශේෂ ශ්‍රේණිය ලබා නොදීම යුක්ති සහගතද යන්න හා නොඑසේනම් ඔහුට කුමන සහනයක් හිමිවිය යුතුද යන්න පිළිබඳව වේ.

**වී. බී. පී. කේ. වීරසිංහ,**
කම්කරු කොමසාරිස්.

2013 ජූලි මස 31 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

09 - 914

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.